# ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

## නේවාසිකාගාර උපපාලකවරියක/ උපපාලකවරයකු සඳහා සුදුසු නේවාසික ස්ථානයක් කුලියට ගැනීම සඳහා අයදුම්පත් කැඳවීම

ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලයේ පූර්ණ කාලීන නේවාසිකාගාර උපපාලකවරියක/ උපපාලකවරයකු සඳහා නේවාසික පහසුකම් සැපයීමට සුදුසු නිවසක් වසරක කාලයක් සඳහා කුලියට ගැනීමට අයදුම්පත් කැඳවේ. පහත සුදුසුකම් සපුරන නිවාස අයිතිකරුවන්ට මේ සඳහා අයදුම්පත් ඉදිරිපත් කළ හැක.

- විශ්වවිද්‍යාලය අවට කිලෝ මීටර් 1 (එකක්) ඇතුළත පිහිටා තිබීම
- පැහැදිලි හා වෙනමම පිවිසුම් මාර්ගයක් පැවතීම (සැහැල්ලු වාහනයකට හැරවීමට හා නවතා තැබීමට ඉඩ)
- අවම වශයෙන් නිදන කාමර 2ක්, සාලයක්, මුළුතැන්ගෙයක් හා යාබද වැසිකිළි/නානකාමර පැවතීම
- විදුලිය හා ජල පහසුකම් තිබීම
- නිවාස හිමිකරුට අදාළ නිවස පිළිබඳව නිරවුල් හිමිකමක් පැවතීම. (අනවසර ඉදිකිරීම්, ආරවුල් පවතින නිවාස සලකා බලනු නොලැබේ.)
- ප්‍රමාණවත් ආරක්ෂාවක් පැවතීම
- ලංසු කැඳවීමෙන් පසු තෝරාගත් අයදුම්කරුගෙන් එම නිවසේ මාසික කුලී මුදල පිළිබඳව රජයේ තක්සේරු දෙපාරතුමේන්තුවෙන් තිකුත් කරන තක්සේරු වාර්තාවක් ලබා දීම
- අදාළ ගොඩනැගිලිවල හිමිකරුවන් සමග සබරගමුව විශ්වවිද්‍යාලයේ සේවය කරන ඥාතිත්වයක් ඇති අය සිටී නම් එම ඥාති සබඳතාව පිළිබඳව විස්තර සඳහන් කර හෝ නොසිටී නම් ඒ බව සඳහන් කරමින් දිවුරුම් ප්‍රකාශයක් ලබාදීම

මේ සඳහා විශ්වවිද්‍යාලය වෙත නිවාස කුලියට දීමට අදහස් කරන අයදුම්කරුවන් 2025.11.21 දින සිට 2025.12.05 දින දක්වා සතියේ වැඩකරන දිනවල පෙ.ව. 8.30 සිට ප.ව. 4.00 දක්වා ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී/ අධ්‍යයන හා ශිෂ්‍ය සේවා කාර්යාලයෙන් ලබා ගත් අයදුම්පත නිසි ආකාරව සම්පූර්ණ කර නිවසට පිවිසීමට දළ සිතියමක් අයිතිකරුගේ ජාතික හැඳුනුම්පතේ පිටපතක් හා ඉඩමේ ඔප්පුවේ සහතික කරන ලද පිටපතක් සමග ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී/ අධ්‍යයන හා ශිෂ්‍ය සේවා කාර්යාලයට 2025.12.08 දින ප.ව. 2.00ට හෝ ඊට පෙර ඉදිරිපත් කළ යුතු ය. ලංසු විවෘත කිරීම 2025.12.05 දින ප.ව. 2.30 අධ්‍යයන හා ශිෂ්‍ය සේවා කාර්යාලයේ දී සිදු කෙරෙනු ඇත

සැ. යු. - විශ්වවිද්‍යාල ප්‍රසම්පාදන කමිටු තීරණය අවසන් තීරණය වේ.

ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී
ලේඛකාධිකාරී වෙනුවට
අධ්‍යයන හා ශිෂ්‍ය සේවා
ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය
බෙලිහුල්ඔය
2025.11.21

ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී
අධ්‍යයන හා ශිෂ්‍ය සේවා අංශය
ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය